# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1905/16 - 2015 මාර්තු මස 11 වැනි බදාදා - 2015.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර, ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

අංක 1894/3 සහ 2014 දෙසැම්බර් මස 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර, ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" ප්‍රකාශයට පත් කිරීමේ දිනය 2015 ජනවාරි මස 07 වැනි දින වශයෙන් පළ වී ඇත. එම දිනය 2014 දෙසැම්බර් මස 22 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ආචාර්ය අයි. එච්. කේ. මහානාම,
ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය.

2015 මාර්තු මස 09 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

03 - 774

---

### බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත

3 වන වගන්තිය යටතේ නියමය

1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධිත) ආඥා පනතේ 3 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බුද්ධ ශාසන අමාත්‍ය කරු ජයසූරිය වන මම, අංක 1614/30 හා 2009 අගෝස්තු මස 14 වන සිකුරාදා දින *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළකරන ලද, රුහුණු මහා කතරගම දේවාලය එම ආඥා පනතේ 14 වැනි වගන්තියේ (ඇ ඇ) ඡේදයේ විධිවිධාන වලින් නිදහස් කරමින් කරන ලද නියමය හා අංක 1801/39 හා 2013 මාර්තු මස 15 වන සිකුරාදා දින *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළකරන ලද, රුහුණු මහා කතරගම දේවාලය එම ආඥා පනතේ 12 වැනි වගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදයේ දැක්වෙන "එහෙත් එසේ දීර්ඝ කරනු ලබන කාලවල සමස්ථය අවුරුදු දෙකක් නොඉක්මවිය යුතුය." යන විධිවිධාන වලින් නිදහස් කරමින් කරන ලද නියමය වර්ෂ 2015 ක් වූ මාර්තු මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරමි.

කරු ජයසූරිය,
බුද්ධ ශාසන අමාත්‍ය.

2015 මාර්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

03 - 735

1A - G 21175 — 15 (2015/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*